**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු වලට පත් කිරීම**

**(ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණිය)**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොදා ගැනීමට අනුමත ලකුණු පරිපාටිය**

**1. ජ්‍යෙෂ්ඨතාවය** **උපරිම ලකුණු 30**

ශ්‍රී ලං.අ.ප.සේ. සේවා ව්‍යවස්ථාව ප්‍රකාර මූලික සුදුසුකම් යටතේ දක්වා ඇති I ශ්‍රේණියේ වසර 5ක සතුටුදායක සේවා කාලයට අතිරේකව ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව මෙම ලකුණු ලබා දෙනු ලැබේ.

ඒ අනුව, අදාළ තනතුරට ඉල්ලුම් කරන නිලධාරීන් අතුරින් ඉහත පරිදි වැඩිම අතිරේක සේවා කාලයක් (ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ වසර 5ක සතුටුදායක සේවා කාලයට අතිරේකව) සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද, සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස ද ලකුණු හිමි වන පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

**සටහන :** ශ්‍රී ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ වසර දෙක (02) ක සේවා කාලයක් සහිතව II හා III ශ්‍රේණි වල වසර 12කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරාලීමෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරීන්ගේ, එම මුළු සේවා කාලය වසර 12ට සහ II ශ්‍රේණියේ වසර 02ට වඩා වූ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ද I ශ්‍රේණියේ සේවා කාලයක් සේ සලකා ලකුණු ලබා දෙනු ලැබේ.

**2. ක්ෂේත්‍රයෙහි සේවා පළපුරුද්ද** **උපරිම ලකුණු 15**

(අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම් ලිපි සඳහා පමණක් උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ)

2.1 පාසල් කළමණාකරණයේ පළපුරුද්ද ලකුණු 10
(ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ අනුමත විදුහල්පති තනතුරක එක් වසරකට ලකුණු 1 බැගින්)

2.2 කාර්යාල කළමණාකරණයේ පළපුරුද්ද ලකුණු 10
(විදුහල්පති තනතුරක හැර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වෙනත් තනතුරක එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින්)

**3. අධ්‍යාපන සුදුසුකම්** **උපරිම ලකුණු 10**

3.1 දර්ශනශූරි (PhD) - ලකුණු 10
3.2 දර්ශනපති (M Phil) - ලකුණු 07
3.3 පශ්චාත් උපාධිය - ලකුණු 05
3.4 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 03

(කාර්යක්ෂමතා කඩඉම් වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් හැර වෙනත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ඉහත ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන අතර එක් සහතිකයකට / ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. තව ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල / ආයතන වෙතින් හදාරා ඇති සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන හෝ අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් අදාළ ලකුණු ලබා දෙනු ලැබේ)

**4. නිර්මාණශීලීත්වය හා වෘත්තීය සංවර්ධනය** **උපරිම ලකුණු 15**

4.1 වෘත්තීය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ලකුණු 10

(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර වෘත්තීය ක්ෂේත්‍රයට අදාළව ප්‍රසිද්ධ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කරන ලද විධිමත්ව අවසන් කරන ලද එක් පර්යේෂණ වාර්තාවකට ලකුණු 05 බැගින් උපරිම පර්යේෂණ 02ක් සඳහා ලකුණු දෙනු ලැබේ)



Scanned with MOBILE SCANNER

4.2 ප්‍රකාශයට පත් කර ඇති සඟරා, ලිපි, ප්‍රකාශන ආදිය ලකුණු 5

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් අනුමැතිය ලද ග්‍රන්ථ සඳහා පමණක් ද පුවත්පත් හා සඟරා වල පළ කර ඇති ලිපි, වාර්තා හෝ ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේදී අධ්‍යාපන ලේකම් විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම සුදුසු යැයි තීරණය කරනු ලබන ප්‍රකාශන සඳහා ද එක් ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් උපරිම ප්‍රකාශන 03ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ)

**5. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** **උපරිම ලකුණු 05**

(මෙහෙයුම් මෘදුකාංග, භාවිත මෘදුකාංග හැසිරවීම පිළිබඳ ප්‍රායෝගික දැනුම හා පරිගණක දෘඩාංග පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කර බලනු ලැබේ)

**6. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය** **උපරිම ලකුණු 05**

(ඉංග්‍රීසි භාෂාව හැසිරවීම පිළිබඳව ප්‍රායෝගික භාවිතය හා නිපුනතාවය පරීක්ෂා කර බලනු ලැබේ.)

**7. සේවා ඇගයීම් / ප්‍රශංසා සහතික / සම්මාන සහතික / ජයග්‍රහණ** **උපරිම ලකුණු 05**

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා එකකට ලකුණු 01 බැගින් උපරිම සේවා ඇගයීම් 05ක් සඳහා

**සටහන : (දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු පළාත් ප්‍රධාන ලේකම්, පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් වේ)**

**8. ඉදිරිපත් කිරීම** **උපරිම ලකුණු 10**

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා, වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති සහ 21 වැනි සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අභියෝග පිළිබඳ අවධානය යොමු කරමින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු ලෙස අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන ආකාරය පිළිබඳව, තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කර ගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර, **එම ඉදිරිපත් කිරීමට** අදාළ දෘශ්‍ය පිටපතක් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

එම ඉදිරිපත් කිරීම සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| I. | ප්‍රවේශය හා හැඳින්වීම | - ලකුණු 2 |
| II. | අන්තර්ගතය | - ලකුණු 2 |
| III. | කාල කළමනාකරණය | - ලකුණු 2 |
| IV. | ඉදිරිපත් කිරීමේ විලාශය | - ලකුණු 2 |
| V. | නිගමනය හා නිමාව | - ලකුණු 2 |

**9. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන සමස්ථ කුසලතාව** **උපරිම ලකුණු 05**

**100**



Scanned with MOBILE SCANNER